# සංස්කෘතිය, දේශපාලනය සහ ශ්‍රී ලංකාවේ අනාගතය

ප්‍රශාන්ත ගුණවර්ධන, නිලන්ති බණ්ඩාර, හරේන්ද්‍රලාල් නාමල්ගමුව, මෙලානි සල්ඩින්

පුරාණ ග්‍රීක දාර්ශනය තුළ ගණිතය, ඉතිහාසය, කාව්‍ය හා දේශපාලන විෂය ක්ෂේත්‍ර අතර විශේෂ වෙනසක් දක්නට නොලැබිණි. ගණිතය විෂය ධාරාව තුළ ඇති වූ වර්ධනයත් සමඟ විද්‍යාත්මක විෂය ධාරාවන් හා මානව ශාස්ත්‍ර අතර වෙනස ඉස්මතුවන්නට විය. ඇරිස්ටෝටල් විසින් ග්‍රහලෝක වෙනස්වීම හා කාව්‍ය අධ්‍යයනය සඳහා ක්‍රමානුකූල විධික්‍රමයක් අනුගමනය කළේය.

ඉස්ලාම් ශිෂ්ටාචාරය තුළ මුස්ලිම් ජාතික විද්වතුන් සමාජීයවිද්‍යා විෂයයන්හි වර්ධනය උදෙසා විශාල කාර්යභාරයක් ඉටුකර ඇත. අල්බෘනි (ක්‍රි.ව.973-1048) නම් මානව විද්‍යාඥයා ජනතාවගේ මානව විද්‍යාව, මධ්‍යදරණී කලාපයේ සහ දකුණු ආසියාවේ සංස්කෘතිය පිළිබඳ සවිස්තරාත්මක අධ්‍යයනයක් කළේය(Singleton and Straits, 1988). මෙය අනෙකුත් පර්යේෂකයන් ආකර්ශනය කිරීමට හේතුවිය. මෙහිදී ඉබන් බතූතා (ක්‍රි.ව.1332-1046) විසින් ජනගහන අධ්‍යයනය, ඓතිහාසිකත්වය, දර්ශනයේ ඉතිහාසය ආදියෙහි පුරෝගාමී මෙහෙවරක් ඉටුකළේය. විලියම් ජේම්ස්, ජෝන් ඩේවි විසින් 20 වන සියවස මුල්භාගයේ මාක්ස්වාදය හෙගලියානු වාදය පදනම් වූ දාර්ශනික මතවාද සමාජවිද්‍යා ක්ෂේත්‍රයට සම්බන්ධ කිරීමට උත්සාහ කළේය. එම පර්යේෂණයේ මූලික පදනම්වූයේ ගැටළු දිශානතිය, දත්තවල හුදකලා බව ඇතුළු විෂය කරුණු, ආනුභවික පර්යේෂණ ආදියයි(Singleton and Straits, 1988). මෙම අදහස්වල ව්‍යාප්තියත් සමඟ දැනුම යන්න සංඛ්‍යාත්මකව ගණනය කොට එය අඩු දැනුමක් සහිත එකක් යන්න නිර්ණය කළ නොහැකි බව ප්‍රකාශ විය. 20 වන සියවස මධ්‍ය භාගය වන විට බහු ජාතික සමාගම්, රාජ්‍ය හා පෞද්ගලික ආයතනවලට දත්ත බොහෝ වශයෙන් අවශ්‍ය විය. එහි දී සිදු වූයේ සවිස්තරාත්මක පුළුල් වාර්තා අඩු වී ඡායාරූප, වගු, ප්‍රස්ථාර ඇතුල්වීමෙන් වඩා පහසුවෙන් තේරුම්ගත හැකි අවස්ථාවන් උදාකරලීමයි. අන්තර් විෂයයන් මනුෂ්‍ය හැසිරීම් රටාවන් අධ්‍යයනය කිරීම සඳහා සෘජු බලපෑමක් ඇති කරන ලදී. එහි දී අනෙකුත් විෂයයන් පවා සමාජීය විද්‍යාවේ ක්‍රමවේදයන් ඔස්සේ රදා පවතින බවට පිළිගන්නා ලදී. ඉක්බිතිව සමාජීය විද්‍යාවන් සඳහා ගුණාත්මක හා ප්‍රමාණාත්මක ක්‍රමවේදයන් ඇතුල්වීමෙන් වර්ධනයක් ඇතිවිය. ඉතා විශාලතම ව්‍යාප්තිය සිදුවූයේ නූතන වාදය සමාජීයවිද්‍යා විෂයයන්වලට ඇතුල්වීමත් සමඟය.

විසිඑක්වන සියවසේ අප ඉදිරියේ ඇති සමාජය කලී දැනුම සහිත ආර්ථිකයකි. නැතහොත් දැනුම මත පදනම් වූ සමාජයකි. දැනුමේ සංස්කෘතිය ගොඩනැගීමේදී විශ්වවිද්‍යාල පද්ධතිය සඳහා විශේෂ කාර්යභාරයක් ඇත. තව පර්යේෂණ වැනි අනාගතය ස්ථාවරවීමට නම් ප්‍රතිසංස්කරණ රාශියක් සිදුවිය යුතු ය (Bandaranayake, 2007). විශ්වවිද්‍යාලවල සමාජීයවිද්‍යා පීඨයන්හි සිදුවන පර්යේෂණ පිළිබඳ සතුටුවිය හැකි ප්‍රවනතා 1960-70